වෙළුම V - කලාපය II / 2023 / ISSN 2820-2023

# අධ්‍යාපන සංකල්පය පිළිබඳ බටහිර දාර්ශනික චින්තාවන්

එන්.ඒ. විජයසිරි

## හැඳින්වීම

මිනිසාගේ පරිණාමය ගැන කතා කරනුයේ යම් දිනක සිට ද ඒ තාක් කල් ඈතට දිව යන්නකි, 'අධ්‍යාපනය' නැමැති සංකල්ප ය. මානවයා දෙපයින් නැගී සිට මනසින් සිතා කයින් විවිධ ක්‍රියාකාරකම් කිරීමට පටන් ගත්තේ ද ඒ සියල්ල තුළ අධ්‍යාපන සංකල්පයන් අන්තර්ගතව පවති යි. සියවස් ගණනාවක් තිස්සේ පරිණාමය වෙමින් පැවත එන මෙම සංකල්පයට ෂෙෆ්ලර් (Sheffler) විසින් නිර්වචනයක් දී තිබේ. ඒ ''අධ්‍යාපනය සංකල්පයෙහි අන්තර්ගත විවිධ ලක්ෂණ සමස්තයක් ලෙස තවම හෙළිදරව්ව සලකුණු වී නොමැත. එහි මතු වී ඇති දෙයට වඩා මතු නොවූ දෑ බොහෝ ය'' (ෂෙෆ්ලර්, 1970ඃ01) වශයෙනි.

අධ්‍යාපනය (ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය) කිසිදා එකම තැනක ඒකරූපීව නිශ්චල වස්තුවක් මෙන් පවතින්නේ නැත. මෙය රටින් රටට, ජනවර්ගයෙන් ජනවර්ගයට, ආර්ථික, සාමාජික, සංස්කෘතික, දේශපාලනික, තාක්ෂණික බලපෑම හේතුවෙන් කාලයෙන් කාලයට වෙනස් වෙමින් පැවත එනු ලබයි. එහි දී නව අදහස් නව චිත්තනයන් නිරන්තරයෙන් සමාජගත වනු දැකිය හැකි ය. ෂෙෆ්ලර්ගේ උක්ත ප්‍රකාශය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී වීරසිංහ (1993) දක්වා තිබෙන පහත අදහස ඉතා වැදගත් ය. ''අධ්‍යාපනය කිසියම් නිශ්චිත ගතානුගතික අදහස් රාමුවක් තුළ ලැග නොසිටින බව ය. සංස්කෘතික, ආර්ථික, දේශපාලනික හා සාමාජික සාධක හා නිරන්තරයෙන් ගැටෙමින් අලුත් දැනීම් සම්භාර, අලුත් චින්තන විලාශ, අලුත් සමාජ රටා, අලුත් ජීවන දර්ශන, අලුත් සමාජ සම්බන්ධතා මිනිස් චින්තනයේ ප්‍රමාණයට හා භාවිතයට සාපේක්ෂව නිරන්තරයෙන් ගොඩ නැගෙන බව ය'' (වීරසිංහ, 1993.10).

වත්මන් සමාජය තුළ දකින්නට ලැබෙන සුවිශේෂ තත්ත්වයකි, මිනිස් ක්‍රියාකාරකම් අතික්‍රමණය කරමින් තාක්ෂණික ක්‍රියාකාරකම් පෙරමුණ ගෙන තිබීම. සාමාන්‍ය මිනිසාට සිතා ගන්නටවත් නොහැකි තරමට විවිධ සිදුවීම් සිදුවෙමින් පවතියි. මේ සියල්ල පිටුපස සැඟව තිබෙන්නේ විධිමත් හෝ අවිධිමත් අධ්‍යාපනය යි. මේ සා විශාල යුග පෙරළියකට සමාජය පරිවර්තනය වීමෙහිලා නූතන හා පැරණි අධ්‍යාපන දාර්ශනිකයින්ගේ අදහස් විශාල බලපෑමක් කර ඇති බව නොරහසකි. විශේෂයෙන් මේ කෙරෙහි නූතන බටහිර දාර්ශනිකයින්ගේ අධ්‍යාපනික අදහස්වල බලපෑම කෙසේ සිදු වී තිබේ ද යන්න විමසා බැලීමක් පමණක් මෙහි දී සිදු වේ.

කිසියම් දර්ශනයක් කාලයෙන් කාලයට වෙනස් වෙමින් පැවත එන විට එය නූතන පැරණි වශයෙන් බෙදා දැක්වීමේ දී අනුගමනය කරනු ලබන මිනුම් දඬු පිළිබඳ නිශ්චිත බවක් හෝ පැහැදිලි අදහස් දැක්වීමක් කර තිබෙන බවක් පෙනෙන්නට නැත. රූලක් පෑනක් ගෙන ඉරක් ගසා කොටස් දෙක වෙන් කර ඒ පිළිබඳ අදහස් දක්වන්නාක් මෙන් මෙය කළ නොහැකි ය. වසර දහස් ගණනක් පැරණි අධ්‍යාපන දර්ශනය පෝෂණය කිරීමෙහි ලා දායක වූවෝ බොහෝ වෙති. ඔවුන් පැරණි හා නූතන වශයෙන් වෙන් කර දැක්වීම එතරම් පහසු නැත. කෙසේ වෙතත් ඒ ඒ දාර්ශනිකයින් බුද්ධිමතුන් ජීවත් වූ කාල වකවානු සැලකිල්ලට ගෙන යම් බෙදා දැක්වීමක් කළ හැකි ය. ඒ අනුව අධ්‍යාපනය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අය අතුරින් පහත සඳහන් බටහිර අධ්‍යාපන දාර්ශනිකයින් කිහිප දෙනා අමතක කළ නොහැකි ය.

- බර්ට්‍රන් රසල් - 1872 - 1970 (Bertrand Russell)
- ලෙව් විගොට්ස්කි - 1896 - 1934 (Lev Vygotsky)
- ජීන් පියාජේ - 1896 - 1980 (Jean Piaget)
- මාග්‍රට් මීඩ් - 1901 - 1978 (Margaret Mead)
- කාල් රෝජර්ස් - 1902 - 1979 (Carl Rogers)
- මෝටිමර් ඇඩ්ලර් - 1902 - 2001 (Mortimer Adler)

- ඒබ්‍රහම් මාස්ලෝ - 1908 - 1970 (Abraham Maslow)
- ෆවුලෝ ෆෙයර් - 1921 - 1997 (Paulo Freire)
- නෙල් නෝඩින්ග්ස් - 1929 - 2022 (Nel Noddings)
- කෙන් රොබින්සන් - 1950 - 2020 (Ken Robinson)

මොවුනතුරින් කිහිප දෙනෙකුගේ අධ්‍යාපනය පිළිබඳ දාර්ශනික අදහස් ගැන කෙටි හඳුන්වාදීමක් හා එය වර්තමාන අධ්‍යාපනයට සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

**බර්ට්‍රන් රසල් (Bertrand Russell) - [1872 - 1970]**

විසිවන ශත වර්ෂයේ පහළ වූ අධ්‍යාපන දාර්ශනිකයන් අතුරින් අද්විතීය පෞරුෂයකින් හෙබි ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයෙකි, බර්ට්‍රන් රසල්. වංශාධිපති පවුලකින් පැවත එන මොහු 1872 වර්ෂයේ මැයි මස 18 වන දින වේල්ස් හි ට්‍රෙලෙක් (Trelleck) නගරයේ දී උපත ලැබී ය. මොහුට පිය පාර්ශ්වයෙන් ලැබෙන ''නිදහස් චින්තනය'' මොහු දාර්ශනිකයෙකු වීමට ප්‍රධාන හේතුවක් විය. දර්ශනයට පමණක් සීමා නොවූ මොහු විද්‍යාව, ගණිතය, දේශපාලනය, ආචාර ධර්ම, සමාජ විද්‍යාව, ආගම, අධ්‍යාපනය, වැනි විෂය ක්ෂේත්‍ර පිළිබඳ ලිපි හා පොත් රැසක් ලියා තිබේ.

1925 දී බර්ට්‍රන් රසල් විසින් ලියන ලද ''ඔන් එඩියුකේෂන්'' (On Education) නැමැති කෘතිය කේ.ඒ.එන්. පෙරේරා විසින් ''අධ්‍යාපනය පිළිබඳ රසල්ගේ මතය'' නමින් සිංහලයට පරිවර්තනය කරන ලදී. එහි පෙරවදනේ දී රසල් විසින් අධ්‍යාපනයේ මූලික පරමාර්ථ දෙකක් පිළිබඳ සාකච්ඡා කරන බව පෙන්වා දී තිබේ. ඒ ''අධ්‍යාපනය මඟින් ප්‍රධාන පරමාර්ථ දෙකක් ඉටුවිය යුතු බව රසල් ප්‍රකාශ කළේ ය. නිර්භීත වූත් නිහතමානී වූත් චරිතයකින් හෙබි දරුවකු තැනීම ඉන් පළමු වැන්න ය. දෙවැනි පරමාර්ථය විය යුත්තේ දරුවාගේ බුද්ධිය වර්ධනය කිරීම යි'' (පෙරේරා, 2002ඃංස) වශයෙනි.

අධ්‍යාපනය සම්බන්ධයෙන් රසල් දක්වන මෙම අදහස පෙරදිග අධ්‍යාපන දර්ශනය තුළින් ද හඳුනාගත හැකි ය. බෞද්ධ

අධ්‍යාපන දර්ශනයේ දී සාකච්ඡා වන දෙමාපියන්ගෙන් දරුවන්ට හා ගුරුවරුන්ගෙන් සිසුන්ට ඉටුවිය යුතු යුතුකම්වල දී පැහැදිලිව පෙන්වා දී තිබෙන්නේ මුලින් ම දරුවන් පවින්, වරදින් මුදවා (චරිතවත් පුද්ගලයන් කර) පසුව ශිල්ප ලබා දී බුද්ධිමතුන් කළ යුතු බව යි. මේ අනුව අධ්‍යාපනයේ දී මුලින් ම දරුවන්ට ලබා දිය යුතු වන්නේ චරිත සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් ය. එය පෙර පාසලේ සිට ම සිදු විය යුතු ය. ඉන් පසුවය බුද්ධි සංවර්ධන සඳහා ක්‍රියාකාරකම් ලබා දිය යුතු වන්නේ පිරිහුණු චරිතයක් සහිත බුද්ධියකින් හෝ ඌන බුද්ධියක් සහිත චරිතයකින් බලාරොත්තු වන අරමුණු ඉටු වන්නේ නැත. සමබර පෞරුෂයකින් යුත් පුද්ගලයෙකු නිර්මාණය වන්නේ චරිතය හා බුද්ධිය යන දෙයංශයම එක ලෙස සංවර්ධනය වුවහොත් පමණි. අධ්‍යාපන අරමුණු සකස් කිරීමේ දී මේ අංශ දෙක කෙරෙහිම අවධානය යොමු විය යුතු බව රසල්ගේ අදහසයි. නිශ්චිතව ප්‍රාථමික මූලාශ්‍රය යොදා ගනිමින් මෙවැනි ශාස්ත්‍රීය ලිපියකට කරුණු දැක්වීම වැදගත් වේ.

එමෙන් ම රසල්ගේ දාර්ශනික අදහස් අධ්‍යාපන ක්ෂේත්‍රයට බල පා තිබේ. ඒ ඔහුගේ තාර්කික විශ්ලේෂණය, විවේචනාත්මක චින්තනය, විද්‍යාත්මක සෙවණැලි, නිදහස් සිතුවිල්ල හා ආගමික දේශපාලනික විවේචනාදිය නිසාවෙනි. විශේෂයෙන් අධ්‍යාපනය තුළ සිසුන්ට තාක්ෂණිකව හා බුද්ධිමත්ව කල්පනා කිරීමට උදව් කළ යුතු බව හා කිසියම් අදහසක් අනුගමනය කිරීමට හෝ පිළිගැනීමට පෙර සාධක පරීක්ෂා කර එහි හේතුඵල සම්බන්ධතාව අධ්‍යාපනය කළ යුතු බව ඔහු පවස යි. එපමණක් නොව ඉගැන්වීමේ දී සිසුන්ට එක එල්ලේ යමක් පිළිගැන්වීම වෙනුවට එය විවිධ කෝණයන්ගෙන් උරගා බැලීමට අවස්ථාව සලසා දිය යුතු බව පෙන්වා දෙන ලදී. විද්‍යාත්මක ක්‍රමවේද සහ විශ්ලේෂණාත්මක සිතීම මත පදනම්ව දැනුම ලබා ගත යුතු බව රසල්ගේ අදහස විය. පාසල් හා විශ්වවිද්‍යාල, විවිධ කණ්ඩායම්වල අනුග්‍රාහකත්වයෙන් හා බලපෑම්වලින් මුදවා ගත යුතු අතරම ආගම, දේශපාලනය හා සංස්කෘතිය පිළිබඳ සංවාද මණ්ඩප ඇති කළ යුතු බව පෙන්වා දෙන ලදී. ඔහුට අනුව අධ්‍යාපනයේ අරමුණු විය යුත්තේ සීමාවන් ආවරණය කිරීම නොව නව නිර්මාණ බිහි කරන විචාරශීලීව සිතිය හැකි පුද්ගලයින් බිහි කිරීම යි.

## ලෙව් විගොට්ස්කි (Lev Vygotsky) - [1896 - 1934]

අවුරුදු 38 ක් තරම් කෙටි කාලයක් ජීවත් වූ විගොට්ස්කි රුසියානු ජාතික මනෝවිද්‍යාඥයෙකි. ඔහු ඉදිරිපත් කළ ''නව නිර්මාණවාදී'' (Constructivism) මතවාදය හෙවත් ''සමාජ නිර්මාපී ඉගෙනුම් න්‍යාය'' මඟින් පැහැදිලි කරනු ලැබුවේ කෙනෙකුගේ සැබෑ සංවර්ධනයට ඉහළින් විභව්‍ය සංවර්ධනයක් පවතින බවයි. ශිෂ්‍යයා විභව්‍ය සංවර්ධන මටට්ම කරා පැමිණෙන්නේ මූලික වශයෙන් භාෂාව කේන්ද්‍ර කර ගනිමිනි. එහි දී තම අවට සිටින බුද්ධිමත් පිරිස් සමඟ සමාජානුයෝජනය ඉතා වැදගත් ය. මෙම අදහස විගොට්ස්කි විසින් විස්තර කර තිබෙන්නේ මෙසේ ය. ''තමන්ට ස්වෛරී ලෙස ඇති කර ගත හැකි ප්‍රශ්න විසඳීමේ හැකියාව ද, වැඩිහිටියෙකුගේ මඟ පෙන්වීම යටතේ හෝ වැඩි හැකියාවන්ගෙන් හෙබි සම වයස් සගයන්ගේ මඟ පෙන්වීම යටතේ හෝ අත්කර ගනු ලබන ශක්ති සම්පන්න හැකියාව ද අතර දෘශ්‍යමාන වෙනසක් පවතී'' (විගොට්ස්කි, 1978 : 86) යනුවෙනි.

කෙනෙකුට කිසියම් ගැටලුවක් ප්‍රශ්නයක් ඇති වුණු අවස්ථාවක දී එය තම හැකියාවෙන් විසඳා ගන්නවාට වඩා වැඩිහිටියෙකුගේ මැදිහත් වීම මත හෝ වැඩි හැකියාවන්ගෙන් යුත් සම වයස් කණ්ඩායම්වල මඟ පෙන්වීම යටතේ විසඳා ගැනීමට පෙළඹීම වඩාත් සුදුසු බව යි. මෙය උපරි සංවර්ධන කලාපය ලෙස හැඳින්වේ. මෙය තවදුරටත් විග්‍රහ කර බැලීමේ දී අන්තර් පුද්ගල සම්බන්ධතා, අන්තර් පුද්ගල ක්‍රියාකාරකම් අධ්‍යාපන ක්‍රියාවලියේ දී ප්‍රබල ලෙස බලපාන බව පෙන්වා දෙයි. නමුත් මෙහි දී සමහර අන්තර් පුද්ගල ක්‍රියාකාරකම් මඟින් ඇති කරවනු ලබන අහිතකර තත්ත්වයන් පිළිබඳව කිසිවක් ඔහු පවසා නැත. විගොට්ස්කිගේ පර්යේෂණ තුළින් ඔහු විසින් අනාවරණය කර ගන්නා ලද සුවිශේෂි කරුණු කිහිපයක් මෙසේ දක්වා ඇත.

නිශ්ශබ්ද කථනය හෙවත් ඇතුළත කථනය පළමු වැන්නයි. මෙයින් අදහස් වන්නේ බාහිර සමාජයේ පුද්ගලයන්ගේ කතා බහ අසාගෙන එයින් උකහා ගන්නා දේවල් යළි මෙනෙහි කරමින් ඒවා ආශ්‍රිතව යෙදෙන ආවර්ජනය යි. මෙය 'ස්වයං කථනය' (Self Talk) හෙවත් 'ආත්ම කේන්ද්‍රීය භාෂණය' (Egocentric) ලෙස ද හැඳින්වේ. මෙයින් චින්තනය සැකසෙයි. ළමයාගේ චින්තනය, බාහිර

දියුණු සමාජයේ අන්‍යන්ගෙන් ලැබෙන භාෂාත්මක අන්තර්ක්‍රියා හේතුකොටගෙන සිදුවන බව මෙයින් අදහස් වේ.

- ආත්ම කේන්ද්‍රීය කථනය දෙවන අවස්ථාවේ දී සමාජ කථනය හෙවත් බාහිර කථනය බවට පත්වේ. සමාජ කථනය සිදුවන්නේ ළමයා සමාජයේ අන්‍ය පුද්ගලයන් සමඟ අන්තර්ක්‍රියා පැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
- ළමයා තුළ භාෂාවක් සංවර්ධනය වීමට නම් ඇතුළත කථනය මෙන් බාහිර කථනය ද සංවර්ධනය වීම අවශ්‍ය වේ. ඇතුළත කථනයට මුල් වන්නේ සමාජීය බාහිර කථනය යි. ඉන් උරාගෙන ළමයා ඇතුළත කථනය ගොඩ නගා ගනියි. ඇතුළත කථනය භාෂාව බවට පත්කරමින් නැවත සමාජයේ බාහිර කථනයට යොමු වෙයි.
- සමාජ අන්තර් ක්‍රියාකාරීත්ව මඟින් පුද්ගලයාගේ භාෂාව සංවර්ධනය වීම සිදු වේ.
- භාෂාව ඉගෙනීමට නම් අනෙක් තැනැත්තා වඩා දක්ෂයෙකු විය යුතු ය (The more Knowlegeable other).
- උපරි සංවර්ධන කලාපය
  (Zone of Proximal Development - ZPD)

(පුද්ගලයා අසල සමීපස්ථව තිබෙන ළඟා කරගත හැකි ඥාන සම්භාරය) (ඉගෙනුම් සම්පත් සංග්‍රහය, 2012:13-14).

විගොට්ස්කිට අනුව දැනුම අසුන්ගත ක්‍රියාකාරකම්වලින් පමණක් ලබා ගැනීමට නොපෙළඹිය යුතු ය. ඊට වඩා වැදගත් වනුයේ සමාජානුයෝජන ක්‍රියාවලිය යි. එහි දී ඇති කරගනු ලබන අන්තර් සම්බන්ධතා වඩාත් ධනාත්මක නම් එය දරුවාගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනයට ප්‍රබල සාධකයක් වන බවයි, විගොට්ස්කි තම පර්යේෂණ තුළින් පෙන්වා දෙනු ලබන්නේ.

**ජීන් පියාජේ (Jean Piaget)** - **[1896 - 1980]**

ලෝ සුපතළ මනෝවිද්‍යාඥයෙකු වූ මහාචාර්ය ජීන් පියාජේ 1896 වර්ෂයේ අගෝස්තු මස 09 වන දින ස්විස්ටර්ලන්තයේ දී උපත

ලැබීය. මනෝවිද්‍යා ක්ෂේත්‍රයෙහි පෘථුල දැනුමක් තිබූ මෙතුමා ඒ ඔස්සේ බුද්ධියෙහි ගුණාත්මක වර්ධනය පිළිබඳව නව චින්තනයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා තෝරාගනු ලැබුවේ ලූසිනි, ජැකොලයින් සහ ලෝරන්ට් යන සිය දරුවන් තිදෙනා ය. ඔවුන්ගේ උපතේ සිට යෞවනය දක්වා ක්‍රියාකාරකම් කෙරෙහි නිරීක්ෂණය කර ලබා ගත් දැනුම පසුව පාසල් යන සම වයසේ දරුවන් සමඟ සන්සන්දනය කරමින් අත්හදා බැලීම් කර තිබේ. ඒ ඔස්සේ සිය බුද්ධි සංවර්ධන න්‍යාය ගොඩ නගන ලදී. ඒ සඳහා ගණිත සංකල්ප, තර්කනය, වර්ගීකරණය යන සංකල්පය ද පාදක කරගෙන ඇත. එහි දී ඔහු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රධාන බුද්ධි සංවර්ධන අවස්ථා හා අනු අවස්ථා වයස් සීමාවන්ද සමඟින් මෙසේ ඉදිරිපත් කළ හැකි ය (අධීක්ෂා, 2011ඃ64-65).

**01. ඉන්ද්‍රියචාලක අවධිය (Sensory Motor Stage) උපතේ සිට අවුඃ 02 දක්වා**

I. සරල ප්‍රතීක ක්‍රියා අනු අවධිය (Simple Reflx Excercises) උප්පත්තියේ සිට පළමු මාසය දක්වා

II. ප්‍රාථමික සංසාරි ප්‍රතික්‍රියා අනු අවධිය (Primary Circular Reactions) - මාස 01 සිට මාස 04 දක්වා

III. ද්වීතියික සංසාරී ප්‍රතික්‍රයා අනු අවධිය (Secondary Circular reactions) - මාස 04 සිට මාස 08 දක්වා

IV. ද්වීතියික සංසාරී ක්‍රියාවලින් සමායෝජනය කරන අනු අවධිය (Coordination of Secondary Circular Reactions) - මාස 08 සිට මාස 12 දක්වා

V. තෘතිය සංසාරී ප්‍රතික්‍රයා අනු අවධිය (Tertiary Circular Reactions) - මාස 12 සිට මාස 18 දක්වා

VI. මානසික සංයෝජනයන් මඟින් නව ක්‍රම ගොඩනැංවීමේ අනු අවධිය (The invention of new Means through Mental Combination) - මාස 18 සිට මාස 24 දක්වා

**02. පූර්ව ක්‍රියා චින්තනය අවධිය (Pre Operational Stage)**
**අවුː 02 සිට අවුː 07 දක්වා**

I. පූර්ව සංකල්පන අනු අවධිය (Pre Conceptual Sub Period) - අවුː 02 සිට අවුː 4 1/2 දක්වා

II. ප්‍රතිභා චින්තන අනු අවධිය (Intuitive Thought Sub Period) අවුː 4 1/2 සිට අවුː 07 දක්වා

**03. සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය** (Concrete Operational Stage) - **අවුː 07 සිට අවුː 11 දක්වා**

**04. වියුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය** (Formal Operational Stage) - **අවුː 11 සිට අවුː 14 දක්වා** (Cherry, 2024 : 02).

පියාජේට අනුව සෑම පුද්ගලයෙක්ම මෙම අවධි හතර අනුපිළිවෙලින් පසු කරනු ලබයි. එමෙන් ම මෙම අවධි රටාව අවිචල්‍යය වේ. එනම් පළමු අදියර දෙවන අදියරට පෙරත්, දෙවන අදියර තෙවන අදියරයට පෙරත්, වශයෙන් සංවර්ධනය වන බවයි. එය එසේ වුවද රටවල් අනුව සමාජයන් අනුව පුද්ගල තත්වයන් අනුව මෙය වෙනස් විය හැකි ය (Cherry, 2024 : 02).

පියාජේගේ මෙම බුද්ධි සංවර්ධන අවධි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බෙහෙවින් වැදගත් වනු ඇත. විශේෂයෙන් ගුරුවරයාට ශිෂ්‍යයා හඳුනා ගැනීමේ දී මෙම අවධි පිළිබඳ අවබෝධය ඉතා වැදගත් ය. ඒ ඒ අවධිවල දී ශිෂ්‍යයාට ග්‍රහණය කර ගත හැකි ප්‍රමාණයන් පිළිබඳව දැනුමක් ඇති කරගත් විට ගුරුවරුන්ට ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත්ව සංවිධානය කර ගැනීමට පහසුවක් වනු ඇත. අර්ථවත් රසවත් ඉගැන්වීමක් සඳහා මේ පිළිබඳව දැනුම ගුරුවරුන්ට බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත. පියාජේ පෙන්වා දෙන ආකාරයට ඉක්මන් ඉගැන්වීම් හෝ කලින් ඉගැන්වීම නිෂ්ප්‍රයෝජන ක්‍රියාවකි. දරුවා ඒ ඒ අවධිවල දී තම ප්‍රජානන හැකියා සංවර්ධනය කර ගන්නවා විනා ඉක්මන් ඉගෙනුමකට ඔහු සූදානම් නැත. ඒ සඳහා ගත කරන කාලය, ශ්‍රමය අර්ථ විරහිත ය. පියාජේගේ මෙම බුද්ධි සංවර්ධන අවධි පිළිබඳ විමසිලිමත් වීමේ දී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ සිට

අධ්‍යාපනයේ අරමුණු විෂය නිර්දේශයන් තවදුරටත් සංවර්ධනය විය යුතු බවක් පෙනෙන්නට තිබේ (අධීක්‍ෂා, 2011:64-65).

## මාග්‍රට් මීඩ් (Margaret Mead) - [1901 - 1978]

වර්ෂ 1901 දෙසැම්බර් 18 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ ෆිලඩෙල්ෆියාවේ දී (Philadelphia) උපත ලබන මාග්‍රට් මීඩ් විසිවන සියවසේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මානව විද්‍යාඥවරියකි. මැයගේ පියා ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ අතර මව සමාජ විද්‍යාඥවරියක් වූවා ය. මාග්‍රට් මීඩ් උපදින්නටත් පෙර සිටම අධ්‍යාපනය සඳහා පෙළඹවීම සහිත පරිසරයක් නිවස තුළම නිර්මාණය වී තිබුණි. සෑම සමාජ පංතියකම දරුවන් සමඟ ක්‍රීඩා කිරීමට විනෝද වීමට ඇයට හැකි විය. ඒ හේතුවෙන්ම කුඩා කල සිටම ඇ තුළ සමානාත්මතාවය පිළිබඳ සිතුම් පැතුම් දලු ලා වැඩෙන්නට විය. මේ නිසා ජාති ආගම් කුල භේදාදිය පිළිබඳව පූර්ව නිගමනවලට එළඹෙන්නට ඇයට අවස්ථාවක් නොවී ය.

ලෝක ප්‍රකට මානව විද්‍යාඥවරියක වූ මාග්‍රට් මීඩ් අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්වන ලද අදහස් ඇමරිකාවේ පමණක් නොව ජාත්‍යන්තරයේ ද අවධානයට යොමු විය. විශේෂයෙන් එකල ඇමරිකාවේ පැවති අධ්‍යාපනය සම්බන්ධව ද ඇය තුළ කුකුසක් පැවති බව නොරහසකි. අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇය තුළ වූ ප්‍රබල අදහස වූයේ ඉතා වේගයෙන් වෙනස් වන සමාජයකට දරුවන් හුරු කරන්නේ කෙසේද යන්න ය. මෙහි දී ඇය නව ඉගෙනීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එය පාර්ශ්වීය ඉගෙනුම (Lateral learning) නමින් හඳුන්වයි (Bauer, 2017 : 04). මින් අදහස් කරනුයේ බාල, තරුණ, මහලු භේදයකින් තොරව යමෙක් යමක් නොදන්නෙහිද ඔහුට හෝ ඇයට එය කියා දීම ය. උදා. ලෙස ගත හොත් මුණුපුරෙක් තම සීයාට තාක්ෂණික කරුණු සම්බන්ධව උගන්වන අවස්ථාවක් වැනි ය.

නොදන්නා ලෝකයක නොදන්නා ගැටලු නිරාකරණය කරගත හැකි ගුරුවරුන් අවශ්‍ය බවත්, සිසුන්ටද චන්ද්‍රගාමීන්ට මෙන් ඉගැන්විය යුතු බවත් මාග්‍රට් මීඩ් දැරූ තවත් අදහසකි. විධිමත් ලෙස අධ්‍යාපනය ලැබීමට නොහැකි වූවන්ට තමන් කැමති විෂයන් හදාරා ඕනෑම විභාගයකට ඉදිරිපත් වී සහතික ලබා ගත

හැකි අවස්ථා ඇති කිරීමත්, වැඩිහිටියන් තුළ ඇති සාම්ප්‍රදායික අදහස්වලින් නව අදහස්වලට යොමු කරවීම සඳහා අඛණ්ඩ අධ්‍යාපනය ලබා දීමත් ඇයගේ යෝජනා අතර විය. මූලාශ්‍රය කුමක්ද ලෝකාභිමානය සියලු දෙනාට ඉගැන්විය යුතු බවත්, විවිධ සමාජවල සංස්කෘතීන්, ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත්, පුද පූජා ආදිය ද හැදෑරීම ද කළ යුතු බව ඇයගේ අදහසයි (Bauer, 2017 : 04). මාග්‍රට් මීඩ්ගේ මෙම අධ්‍යාපනික අදහස් තුළින් ගම්‍ය වන පොදු ලක්ෂණය වන්නේ සැබෑ අධ්‍යාපනය යනු ජාති ආගම් කුල භේදාදිය නොසලකා සියල්ලන් සමඟ සමානාත්මතාවයෙන් සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති හැකියාව යි. වර්තමානයේ අධ්‍යාපනය තුළින් ඈත් වෙමින් පවතින්නේ ද මෙම උදාර පරමාර්ථය නොවේ ද?.

**කාල් රෝජර්ස් (Carl Rogers) - [1902 - 1979]**

මනෝ විද්‍යාඥයෙකු, මනෝ චිකිත්සකයෙකු සහ අධ්‍යාපනඥයෙකු වශයෙන් සුපතළ කාල් රෝජර්ස් (Carl Rogers) ඇමරිකාවේ චිකාගෝ නගරයේ දී 1902 ජනවාරි 08 වන දින ප්‍රොතෙස්තන්තු ආගමික පවුලක උපත ලැබීය. මානුෂීය මනෝ විද්‍යාවේ ආරම්භකයෙකු ලෙස ද මොහු සලකනු ලබයි. මෙතුමාගේ කුඩා කල ජීවිතය එතරම් රසවත් වූවක් නොවේ. පවුලෙන් පිටත වෙනත් දරුවන් සමඟ ආශ්‍රය මොහුට තහනම් විය. ස්වෝත්සාහයෙන් අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන ආ මොහු ඔහියෝ (Ohio) විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු ලෙස සේවය කරන ලදී.

1986 වසරේ දී සෝවියට් දේශයේ සංචාරයක නිරතවන කාල් රෝජර්ස්ට එහි සිටින දෙමාපියන් පිරිසක් ආමන්ත්‍රණය කිරීමට අවස්ථාව සැලසෙයි. එහි දී ඔහු දෙමාපියන්ට ලබාදුන් උපදෙස් පිළිබඳව තොරතුරු කාරියවසම් (1998: 39) මෙසේ ගෙන හැර දක්වනු ලබයි. ''ප්‍රථමයෙන් දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන්ට ඇහුම්කන් දීමට පළුවන් විය යුතු ය. එමෙන් ම ඔවුන්ගේ නෙත්වලින් ලෝකය දෙස බැලීමට උත්සාහ කළ යුතු ය. තෙවනුව දෙමාපියනි, ඔබ ඔබ වන්න, මව හෝ පියාගේ භූමිකාව වැළඳ නොගන්න. වැරදි හැඳින ගෙන එම වැරදි පිළිගැනීමට බිය නොවන්න. දරුවන්ගෙන් නොහංගන්න. දරුවන් ඉදිරියේ ඔබේ විවෘත භාවය පවත්වා ගත් විට ඔවුන් ද ඔබට විවෘත වනු ඇත (Rogrigues, 2018: 03).

අතිශය සංවේදී තැන් හඳුනා ගෙන එහි මානුෂික පැතිකඩ පිළිබඳ හඳුන්වා දෙමින් බුද්ධියට කරනු ලබන ආමන්ත්‍රණය කාල් රෝජර්ස් සතු පුද්ගල කේන්ද්‍රීය මනෝ චිකිත්සාවේ ප්‍රබලත්වය නිරූපණය වන අවස්ථාවක් ලෙස මෙය හඳුනා ගත හැකි ය. කාල් රෝජර්ස්ට අනුව අප හැම දෙනා තුළම පවතින පොදු ලක්ෂණයකි සිටින තත්වයට වඩා පියවරකින් හෝ ඉදිරියට යාමේ අපේක්ෂාව. එනම් තම විභවයන් මස්තක ප්‍රාප්ත කර ගැනීමයි. නොඑසේනම් ආත්ම සාක්ෂාත්කරණයයි. මේ වෙනුවෙන් වෙහෙස වී කැප වී ක්‍රියා කරන පුද්ගලයා පූර්ණ ක්‍රියාකාරී පුද්ගලයෙකු ලෙස හඳුන්වනු ලබයි. පුද්ගල කේන්ද්‍රීය චිකිත්සක ක්‍රමය මඟින් පුද්ගලයා විසින් ලබා ගන්නා ඉගෙනුම කාල් රෝජර්ස් විසින් ඉදිරිපත් කර තිබෙන අයුරු කාරියවසම් (1998ඃ 41) මෙසේ දක්වයි.

1. පුද්ගලයා තමා පිළිබඳ නවතාවයෙන් බලයි.
2. ඔහු තමා කවුදැයි හඳුනාගෙන තම හැඟීම් මොනවාදැයි වටහා ගනී.
3. තදබවින් තොරව වඩා සුනම්‍ය වෙයි.
4. යථාර්ථ ජීවිත ඉලක්ක සලකුණු කර ගනියි.
5. ඔහු තම නොගැළපෙන චර්යා අත් හරියි.
6. වඩා පරිණත ලෙස හැසිරෙයි.
7. අන් අයගේ පිළිගැනීමට භාජනය වෙයි.
8. ස්වකීය පෞරුෂය සංවර්ධනාත්මක දිශානතියකට යොමු කරයි.

පූර්ණ ක්‍රියාකාරී පුද්ගලයා නිරතුරුව තමන් සතු කුසලතා පරීක්ෂාවට හා අභියෝගයට ලක් කරමින් ඒවා පරිපූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ගනු ඇත. ඔහු සියල්ල සමඟ මනා හැසිරීමක් සහිත සමෝධානික පුද්ගලයෙකි. ඔහු සතු සුවිශේෂි ලක්ෂණයක් වනුයේ තමන් ගැන මෙන්ම අන්‍යයන් ගැන ද සිතා කටයුතු කිරීමයි. කෙනෙකු පූර්ණ ක්‍රියාකාරී පුද්ගලයෙකු වීම සඳහා පහත සඳහන් අත්දැකීම්, ඉගෙනුම් සම්පූර්ණ කර ගත යුතු ය (Rogrigues, 2018: 03).

1. ඉගෙන ගැනීමේ ක්‍රියාවලියේ දී පුද්ගලයාගේ ආවේදනික හා ප්‍රජානන අංශ ඊට සම්බන්ධ විය යුතු වේ.
2. අනාවරණීය අවශ්‍යතා පිළිබඳ හැඟීම් පුද්ගලයාගේ අභ්‍යන්තරයෙන් ම ජනිත විය යුතු වේ.
3. ඉගෙනීම පුද්ගලයාගේ හැසිරීම, ආකල්ප පෞරුෂය කෙරෙහි බලපායි.
4. අත්දැකීම් ඉගෙනුම සිදුවන විට එහි අර්ථය ඉගෙන ගන්නාගේ අත්දැකීම් සමස්තයට ඇතුළු වේ.

සහභාගී ඉගෙනීම ඉතා වටිනා බව පවසන රෝජර්ස් හොඳින් ඉගෙනීමට නම් පුද්ගල අවශ්‍යතා අනුව එය සිදුවිය යුතු බවත් ඒවා ක්‍රියාවට සම්බන්ධ විය යුතු බව (කාරියවසම්, 1998ඃ 42) පවසා සිටියි.

රෝජර්ස් විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපනික අදහස් අතර තවත් වැදගත් අදහසකි. ඉගැන්වීම වෙනුවට ඉගෙනීම සුසාධ්‍යකරණය කිරීම. එමෙන් ම සම්ප්‍රදායික ඉගැන්වීම් රටාද විවේචනයට ලක් කර තිබේ. මොහුගේ විශ්වාසය නම් මෙම සාම්ප්‍රදායික ඉගැන්වීම් රටා ශිෂ්‍යයා තරගකාරී වීමටත් අසමත් වීමටත් හේතුවන බව යි.

අප හඳුනාගෙන ඇති පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාගේ සුසාධ්‍යකරණ භූමිකාව ඉතා වැදගත් ය. රෝජර්ස් පවසන පරිදි සුසාධ්‍යකාරයෙකු වශයෙන් ගුරු භූමිකාව මෙසේ වෙනස් විය යුතු ආකාරය කාරියවසම් (1998ඃ 45) මෙසේ පෙන්වා දෙයි.

1. කණ්ඩායම් හෝ පන්තියේ ආරම්භක මනෝභාවය හොවත් පරිසරය සකස් කර ගැනීම
2. පන්තියේ සිටිනවුන්ගේ අපේක්ෂණ කවරේදැයි පැහැදිලි කර ගැනීම සහ පොදුවේ පන්තියේ අපේක්ෂණ හඳුනා ගැනීම
3. ඉගෙනීම සඳහා හැකි සෑම මට්ටමේම සම්පත් පහසුවෙන් ලබා ගැනීමට සැලසීම
4. කණ්ඩායම විසින් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි සුනම්‍ය සම්පතක් වශයෙන් තමා ද සලකාලීම

5. පුද්ගලයාගේ බුද්ධි තත්වය හා චිත්තවේගීය ආකල්ප ඒ අයුරින් ම පිළිගැනීම

6. ඔහු ද කණ්ඩායමේ සහභාගී ඉගෙන ගන්නෙකු වශයෙන් සලකා ගැනීම

7. සිසුන්ගේ ගැඹුරු හැඟීම් පිළිබඳ අවදිව සිටීම

8. ස්වකීය සීමාවන් හඳුනාගෙන ඒවා පිළිගැනීම ද වැදගත් වේ.

දරුවන්ට ඉගැන්වීමේ දී ඔවුන්ගේ යථා තත්ත්වය අමතක නොකළ යුතු ය. ඔවුන්ට යථාර්ථයන්ට මුහුණ දීමට අවස්ථාව සලසා දිය යුතු ය. ළමයින්ට උගන්වන විට ඔවුන් වැඩවලින්, වගකීම්වලින් සහ ජීවිත ගැටලුවලින් ඉවත් කර තැබුවහොත් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙනු ඇත. ඉගෙනීම යනු සීමිත කාලයක් තුළ නියමිත විෂය නිර්දේශයන්ගෙන් ලබන දැනුම නොව එය විශ්ව ව්‍යාප්තව පවතින පෘථුල සංකල්පයක් බව කාල් රෝජර්ස්ගේ මෙම අධ්‍යාපනික අදහස් තුළින් පැහැදිලි වේ.

## නිගමනය

යම් අදහසක් නූතනයට ගළපා සාකච්ඡා කිරීමේ දී එහි ප්‍රධාන ලක්ෂණ තුනක් හඳුනා ගත හැකි ය. එනම් එම අදහස අලුතින්ම ඉදිරිපත් කරන්නකි නැතිනම් කලක් භාවිත වී පසුව ඊට එකතු කරන ලද සංශෝධනයකි. එසේත් නැතිනම් ඉඳුරාම වෙනස් වූවකි. මෙතෙක් අප හඳුනාගත් අධ්‍යාපනික අදහස් තුළ ද මෙම ලක්ෂණයන් දක්නට ලැබුණි. රටක අධ්‍යාපන අරමුණු ඉලක්ක අභිමතාර්ථ ගොඩ නැගීමේ දී ඒ ඒ දාර්ශනිකයන් ඉදිරිපත් කර ඇති අදහස් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. විශ්වයම එකම ගම්මානයක් වී තිබෙන වකවානුවක හුදෙකලා ගමනක් වෙනුවට විශ්වයම දෝතට ගත හැකි මඟක් සඳහා අධ්‍යාපනික අරමුණු පෙළ ගැස්විය යුතු ය. ඒ සඳහා මෙම අධ්‍යාපන දාර්ශනික අදහස්වල ඇති වටිනාකම අති මහත් ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අතුකෝරාල, ඩී. සහ අතුකෝරාල, එච්. (2005). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා*. පානදුරඃ ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, ආර්. (2019). *අධ්‍යාපන දර්ශනයේ පෙරදිග චින්තන පැතිකඩ*. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

කලන්සූරිය, ඒ. (1975). *බ'ට්‍රන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය*. වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

කාරියවසම්, සී. (1998). *කාලීන අධ්‍යාපනඥයෝ*. පානදුරඃ ශික්ෂා මන්දිර ප්‍රකාශන.

කාරියවසම්, යූ. සහ කාරියවසම්, ටී. (1992). *අධ්‍යාපනය සහ එහි පදනම*. කොළඹ 10ඃ ස්පීඩ් ප්‍රින්ටර්ස්.

ජයවර්ධන, ඒ. (2018). *සංවර්ධන හා සංවර්ධනය වන රටවල තුලනාත්මක අධ්‍යාපනය*. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ජයසූරිය, සී. (2009). *බුද්ධිය සහ බුද්ධිය මැනීම*. දෙහිවලඃ ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

චන්ද්‍රසේකර, එම්. (2018). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම*. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

පෙරේරා, කේ. (2002). *අධ්‍යාපනය පිළිබඳ රසලගේ මතය*. නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

රිල්ලගොඩගේ, ඩී. (2020). *ගුරු අධ්‍යාපන ලිපි*. බටපොළඃ ශිල්ප ප්‍රකාශන.

රුබේරු, ආර්. (1997). *නව අධ්‍යාපන සංකල්ප*. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසිංහ, එච්. (1999). *අධ්‍යාපන සංකල්ප පෙරදිග හා අපරදිග*. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසිංහ, එච්. (1993). *අධ්‍යාපන දර්ශන ප්‍රවේශය*. නුගේගොඩඃ නිපුණ එන්ටප්‍රයිසස්.

සේනාධීර, එච්. සහ වනසිංහ, එස්. (2002). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ*. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bauer, J.E. (2017). *Mead, Margaret. The Wiley Blackwell Encyclopedia of Social Theory* (Online edition) (pp.1-2). John Wiley & Sons, Ltd. DOI:10.1002/9781118430873.est0486. ResearchGate

Cherry, K. (2024) *Piaget's 4 Stages of Cognitive Development Explained - Background and Key Concepts of Piaget's Theory*. verywell mind.

Rogrigues, J. (2018). *Carl Rogers a huministic Approach*. Post University. ResearchGate.

Sheffler. (1970). *Language of Education*. London: